මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: DPMM/PIMEC
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.01. 27

ව්‍යාපෘති අධීක්ෂණ චක්‍රලේඛ අංක: 01/2025

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

## රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුව - කාර්යභාරය හා මාර්ගෝපදේශ

### I. හැඳින්වීම

මෙරට සමාජ ආර්ථික සංවර්ධනය ප්‍රමුඛ කර ගනිමින් පසුගිය දශකයක පමණ කාලය තුළ සිදු කරන ලද රාජ්‍ය ප්‍රාග්ධන ආයෝජනවලින් අපේක්ෂිත, වියදමට සරිලන ප්‍රතිලාභ මහජනතාවට ජනිත කර දීමට හැකි වී තිබේ ද යන්න ගැටලු සහගතය. ව්‍යාපෘති කළමනාකරණයේ දී සිදුව ඇති පහත දැක්වෙන මූලික දුර්වලතා හේතුවෙන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් මෙරට ආර්ථිකයට වැඩිමනත් වැය බරක් එකතු කර ඇති බව ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම තුළින් පැහැදිළි වේ.

- ව්‍යාපෘති කළමනාකරණ දුර්වලතා හා ව්‍යාපෘති කාර්යයන් සම්බන්ධයෙන් සමීප අධීක්ෂණයේ පවතින අඩුපාඩු.
- කොන්ත්‍රාත් කළමනාකරණ දුර්වලතා.
- ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික උපමානයන් සපුරා නොමැතිකම.
- ඇතැම් සංවර්ධන ව්‍යාපෘති භෞතිකව අවසන් වී ඇතත් එමගින් ජනිත ප්‍රතිලාභ ජනතාව වෙත ගලා යාමේ ප්‍රමාදයන් සිදු වීම.
- ඇතැම් සංවර්ධන ව්‍යාපෘතිවල ණය ආපසු ගෙවීම ආරම්භ කර ඇතත් ව්‍යාපෘතිවල වැඩ අවසන් ව නොතිබීම.
- ව්‍යාපෘතියේ අර්ධ ඉදිකිරීම් පැවතීම හා ඉතිරි වැඩ නිමකිරීම සඳහා කාල රාමු සහිත සැලැස්මක් නොමැතිවීම.
- ව්‍යාපෘති ක්‍රියාකාරකම් ප්‍රමාදවීම හේතුවෙන්, එකඟ වූ උපයෝජන සැළැස්මට අනුකූලව ණය මුදල් කාලීනව නිදහස් කර නොගැනීම සහ ඒ හේතුවෙන් ඇතිවන බැඳීම් (Commitment Fees) ගාස්තු ගෙවීමේ අවස්ථාවන් බහුල වීම.

- ඉංජිනේරු සැලසුම් අඩුපාඩු සහිතවීම හා අතාත්වික වැය ඇස්තමේන්තු හේතුවෙන් මූලිකව අනුමත වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව ඉහළ යාම හා ඒ මත නිරන්තරයෙන් අතිරේක ණය/ අරමුදල් ගැනීමට සිදු වීම.
- ඉහත සඳහන් කරන ලද හේතු මත ව්‍යාපෘතිය නිමකිරීම සඳහා අනුමත මූලික කාල සීමාව ඉක්මවා කාල දිගු ලබා ගැනීම.
- ව්‍යාපෘති කළමනාකරණ ඒකක පවත්වාගෙනයාම සඳහා අධික වියදම් දැරීමට සිදුවීම.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආශ්‍රිතව පැන නගින ඉහත සඳහන් විවිධාකාරයේ දුර්වලතා මග හරවා ගනිමින් ජනතාවට එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිලාභ කාලීනව ජනිත කර දීම උදෙසා වරින් වර යම් යම් ක්‍රමවේද අනුගමනය කර ඇත. විශේෂයෙන් ම, කොවිඩ්-19 වසංගතයත් සමඟ ඇති වූ අර්බුදකාරී ආර්ථික තත්ත්වය හේතුවෙන් මෙරට සංවර්ධන වැඩසටහන්වල/ව්‍යාපෘතිවල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පැන නැගි විවිධ ගැටලු සලකා බලා ව්‍යාපෘති තවදුරටත් පවත්වාගෙන යාම පිළිබඳව තීරණ ගැනීම සඳහා " මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ නිලධාරී කමිටුව (RAMP)" ක්‍රියාත්මක විය. එසේම, එහි අත්දැකීම් ද පදනම් කරගනිමින් තවදුරටත් ව්‍යාපෘති සම්බන්ධයෙන් පැන නැගුණ විවිධ ගැටළු සඳහා උපායමාර්ගික කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ විශේෂ යාන්ත්‍රණයක් වශයෙන් "ජාතික මෙහෙයුම් මැදිරිය (NOR)" ක්‍රියාත්මක විය. ජාතික මෙහෙයුම් මැදිරිය මගින් ලබාදුන් මැදිහත්වීමේ සාධනීය තත්ත්වය සලකා බලා එයට නෛතිකමය වශයෙන් පසුබිමක් සලසා දීමෙන් තවදුරටත් එහි සාධනීය මට්ටම වර්ධනය කිරීම සඳහා 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත තුළ අදාළ විධිවිධාන ඇතුළත් කරමින් මෙම ක්‍රමවේදය බලාත්මක කර ඇත.

ඒ අනුව, 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 44 (3) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධරයන් සහ ගණන් දීමේ නිලධරයන් විසින් සපයනු ලබන තොරතුරු මත පදනම්ව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව කඩිනම් ක්‍රමෝපාය තීරණ ගැනීම උදෙසා සැලසුම්කරණය, සම්පත් විභජනය, අයවැයකරණය, මූල්‍යකරණය සහ අධීක්ෂණය සඳහා වගකිව යුතු ආයතන ප්‍රධානීන් එකොළොස් දෙනෙකුට නොවැඩි සමාජිකයන්ගෙන් සමන්විත වන කමිටුවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ යුතු වේ. රාජ්‍ය ආයෝජන මත ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතිවල සිදුවන ගැටලු හා ප්‍රමාද වළක්වා ගනිමින් එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිලාභ කාලීනව මහජනතාව වෙත ජනිත කර දීම තහවුරු කිරීම උදෙසා කඩිනම් ක්‍රමෝපාය තීරණ ගැනීම මෙමගින් අපේක්ෂා කෙරේ.

## 2. රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් නිලධාරී කමිටුව ස්ථාපිත කිරීම

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම් සම්බන්ධයෙන් වන ඉහත සඳහන් වගන්තිය ප්‍රකාරව **"රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව කඩිනම් ක්‍රමෝපාය තීරණ ගැනීම සඳහා නිලධාරී කමිටුවක් පත් කිරීම"** මැයෙන් යුතුව මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් අංක 24/2313/804/037 සහ 2024.12.22 දිනැති අමාත්‍ය මණ්ඩල

සංදේශය ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, 2024.12.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත "රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුව" පත් කර ඇත.

I. ජනාධිපති ලේකම් විසින් පත් කරනු ලබන අමාත්‍යාංශ ලේකම්වරුන් දෙදෙනෙකු හා ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයෙකු
II. අග්‍රාමාත්‍ය ලේකම් විසින් නම්කරනු ලබන අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම්වරයෙකු
III. භාණ්ඩාගාර ලේකම් විසින් නම් කරනු ලබන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකු
IV. ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
V. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
VI. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
VII. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
VIII. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
IX. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

***සටහන: මෙම කමිටුවේ කාර්යයන් සඳහා අවශ්‍ය යැයි සැලකෙන අන් කවර හෝ නිලධාරියෙකුගේ සේවය කමිටුව විසින් ලබා ගත හැකිය.***

**3. රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුවේ ක්‍රියාකාරීත්වය**

| | | |
|---|---|---|
| කමිටු සභාපතිත්වය | : | ජනාධිපති ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ ලේකම්වරුන් දෙදෙනාගෙන් එක් අයෙකු සහ ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයා මෙම කමිටුවේ සම සභාපතිත්වය දරනු ලැබේ. එසේ වුවද, සම සභාපතිවරයෙක් නොපැමිණි අවස්ථාවක එක් සම සභාපතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවේ කටයුතු පවත්වාගෙන යා හැකිය. |
| කමිටු ලේකම්/කැඳවුම්කරු | : | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මෙම කමිටුවේ සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීමට අමතරව, කමිටු ලේකම්/කැඳවුම්කරු වශයෙන් ද කටයුතු කරනු ලැබේ. |
| කමිටු රැස්වීම් | : | ඉදිරිපත් වන ගැටලු ප්‍රමාණය මත කමිටුව සතියකට වරක් රැස්විය හැකිය. කමිටු රැස්වීම මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී පවත්වනු ලැබේ. |

## 4. රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුවේ කාර්ය නිර්ණායක

- සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යාංශ ලේකම්ගේ හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ විෂය පථයෙන් හා පාලනයෙන් බැහැර සාමූහික ප්‍රයත්නයන් දැරිය යුතු අවස්ථාවල දී ඒ සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය උපාය මාර්ගික තීරණ ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණය හා අදාළ පාර්ශවයන් වෙත උපදෙස් ලබා දීම.

- ව්‍යාපෘතිවල සුමට ක්‍රියාකාරීත්වයට බලපා ඇති විවිධ ගැටලු මග හරවා ගැනීම පිණිස ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධයෙන් ගත යුතු ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පහසු වන පරිදි යෝජනා ඉදිරිපත් කිරීම.

- අවශ්‍ය අවස්ථාවල දී රාජ්‍ය ආයෝජන වැඩසටහන්/ව්‍යාපෘති සම්බන්ධයෙන් අදාළ වන නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

- අමාත්‍ය මණ්ඩල තීරණ මගින් කමිටුව වෙත යොමු කරනු ලබන විධානයන් සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම හා නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම.

- සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් අදාළ වන කොන්ත්‍රාත් ප්‍රජාව, සංවර්ධන පාර්ශවකරුවන්, විද්වතුන් හා විදේශ දූත මණ්ඩල හා නිල නියෝජිතයන් ඇතුළු තෙවන පාර්ශවයන් අවශ්‍ය අවස්ථාවල කැඳවා සාකච්ඡා කිරීම.

- කිසියම් වැඩසටහනක් /ව්‍යාපෘතියක්/ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් ඇගයීමක් (Evaluation) සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් පවතින ක්‍රියාපටිපාටියට අනුගත වෙමින් එම ඇගයීම් සිදු කර නිර්දේශ ඉදිරිපත් කරන ලෙසට අදාළ පාර්ශවයන් වෙත උපදෙස් ලබාදීම.

ඉහත ප්‍රධාන කාර්ය නිර්ණායකයන්ට අමතරව, අංක අමප/22/1871/604/073 හා 2022.11.18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබා දුන් 2022.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පිහිටුවන ලද ජාතික මෙහෙයුම් මැදිරි නිලධාරි කමිටුව විසින් ගනු ලැබූ තීරණ සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග ද මෙම කමිටුවට අදාළ වේ.

## 5. වාර්තා කිරීමේ ක්‍රමවේදය

I. රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුවේ අවධානය යොමු විය යුතු සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ ගැටලු මෙයට යා කොට ඇති ඇමුණුම - 01 ආකෘතියට අනුව සකස් කොට අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අත්සනින් හා නිල මුද්‍රාව සහිතව කමිටුවේ ලේකම් / කැඳවුම්කරු මෙන්ම සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරන ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

II. එසේම, අදාළ රේඛීය අමාත්‍යාංශයට පරිබාහිරව වැඩසටහනකට/ව්‍යාපෘතියකට අදාළ කවර පාර්ශවකරුවෙකු විසින් වුවද රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුවේ මැදිහත්වීම සඳහා කිසියම් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වන ගැටලු ඉදිරිපත් කළ හැකිය. එසේවුවද, මෙවැනි ආකාරයට ඉදිරිපත්වන ගැටලු සම්බන්ධයෙන් කමිටු ලේකම්වරයා එය කමිටුවේ සාකච්ඡා කළ යුතු කරුණක් බවට අදහස් කරන්නේ නම් පමණක් කමිටුව වෙත යොමු කරනු ලැබේ.

III. ඉහත I හා II ඡේදවල සඳහන් පරිදි කිසියම් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් ගැටලු ඉදිරිපත් වූ අවස්ථාවක කමිටු රැස්වීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ සහභාගී වන ලෙස අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත කමිටු ලේකම් / කැඳවුම්කරු විසින් දැනුම් දෙනු ලැබේ.

IV. කමිටු රැස්වීම්වල සාකච්ඡා සටහන් කමිටුවේ සම සභාපතිවරුන් හා සාමාජිකයන් වෙත යොමු කර අනුමැතිය ලැබීමෙන් පසු මෙයට යා කොට ඇති ඇමුණුම - 02 ආකෘති පත්‍රය ප්‍රකාරව විෂයට අදාළ සාකච්ඡා සටහන් අදාළ පාර්ශවයන්ට පිටපත් සහිතව රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත කමිටුවේ ලේකම් / කැඳවුම්කරු විසින් දන්වනු ලැබේ.

කේ. එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. විගණකාධිපති

**Annexure – 01 Template for issues submission to the Officials' Committee on Public Investment Monitoring and Evaluation**

| Issues Submission to the Officials' Committee on Public Investment Monitoring and Evaluation | |
|---|---|
| **Paper No.** | [Office Use] |
| **Name of the Project Executing Agency** | |
| **Name of the Project** | |
| **Entity of Issue Reporting** | |
| **Subject/Issue** | |
| **Background of the Issue** | |
| **Request** | |
| **Justification for the Request** | |
| **Stakeholders and supportive documents if any.** | |
| **Signature of the Secretary and Date** | ...................................... |

## Project Profile

| Name of the Project | | | |
|---|---|---|---|
| Original Project Period | | Cumulative Expenditure (Rs. Mn.) | |
| Time extensions (Months) | | Allocation for 2025 (Rs. Mn.) | |
| Reasons for time extension | | Expenditure 2025 (Rs. Mn.) | |
| Remaining time (Months) | | Balance to be disbursed | |
| Source of Financing | | Cumulative physical Target(%) | |
| Total Estimated Cost at the approval (Rs. Mn.) | | Cumulative Physical Progress (%) | |
| Revised TEC if any (Rs. Mn.) | | Target during the last 06 months (%) | |
| Reasons for cost revision | Scope Change, Price escalation, Other (Pl specify) | Progress during last 06 months(%) | |
| | | No. of staff in the PMU | |
| Other related matters | | Cost of PMU (Per month) (Rs. Mn.) | |

## Annexure -02: Template for disseminating the meeting minutes of Officials' Committee on Public Investment Monitoring and Evaluation

Secretary
Ministry of ...............

### Decisions of the Public Investment Monitoring and Evaluation Officials' Committee Meeting

| **Paper No. :** | **Meeting Date :** |
|---|---|
| **Name of the Project:** | |
| **Request/ Issue:** | |
| **Matters Discussed:** | |
| **Committee Decision:** | |
| **Action By:** | |

.....................
Director General
Department of Project Management and Monitoring and
Secretary/Convener – PIMEC

Copy: ......................